## 2015 පළමු වාර පරීක්ෂණය 11 ශ්‍රේණිය ව්‍යවසායකත්ව අධ්‍යයනය පිළිතුරු පත්‍රය 1/2

**I පත්‍රය** - (ලකුණු 1 x 40 = 40)

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 4 | 02 | 3 | 03 | 1 | 04 | 3 | 05 | 4 | 06 | 1 | 07 | 3 | 08 | 2 |
| 09 | 3 | 10 | 4 | 11 | 2 | 12 | 4 | 13 | 1 | 14 | 2 | 15 | 4 | 16 | 4 |
| 17 | 2 | 18 | 3 | 19 | 4 | 20 | 2 | 21 | 3 | 22 | 2 | 23 | 2 | 24 | 1 |
| 25 | 2 | 26 | 3 | 27 | 4 | 28 | 1 | 29 | 3 | 30 | 2 | 31 | 1 | 32 | 2 |
| 33 | 1 | 34 | 3 | 35 | 4 | 36 | 2 | 37 | 3 | 38 | 1 | 39 | 2 | 40 | 3 |

**II පත්‍රය**

01
(1) විනෝදාංශ, අධ්‍යාපනය, පලපුරුද්ද
(2) ගෙවතු අලංකරණය කරවා ගැනීම, ගෙවතු අලංකරණයට උපදෙස් ලබාගැනීම, ගෙවතු අලංකාරණයට අවශ්‍ය ගඩොල්, ලාම්පු, කණු, වෙනත් කුළුණු, පිළිම ආදී ද්‍රව්‍ය
(3) ලස්සන ගෙවත්තක් / සුන්දර ගෙවත්තක් හෝ ලස්සන වටපිටාවක් / සුන්දර වටපිටාවක්
(4) උත්සාහය, කැපවීම, උන්දුව, අධිෂ්ඨානශීලීබව, නම්‍යශීලීත්වය, ක්‍රියාකාරී බව, ඇල්ම
(5) විසිතුරු පැළ සපයන ව්‍යාපාර, පොහොර සපයන ව්‍යාපාර, ප්‍රවාහනය සපයන ව්‍යාපාර, ගෙවතු සඳහා නඩත්තු සපයන ව්‍යාපාර, ගෙවතු සඳහා විදුලි වැඩ සපයන ව්‍යාපාර
(6) සිමෙන්ති, වැලි, ලස්සන ගල් ආදිය සපයන ව්‍යාපාර / පොහොර හා පැළ සපයන ව්‍යාපාර / නිමකළ ගඩොල්, කුළුණු, ලාම්පු කණු, පිළිම ආදිය සපයන ව්‍යාපාර / ගෙවතු අලංකරණයට අවශ්‍ය විදුලි උපකරණ සපයන ව්‍යාපාර
(7) ගඩොල්, කුළුණු, ලාම්පු කණු, පිළිම ආදිය වෙනත් ව්‍යාපාරවලට සපයන ව්‍යාපාර / එම ද්‍රව්‍ය වෙනත් ව්‍යාපාරවලට ප්‍රවාහනය කිරීමට ප්‍රවාහනය සපයන ව්‍යාපාර / විවිධ ආකාරවලට සකස් කරන ලද පැළ වෙනත් ආයතනවලට සපයන ව්‍යාපාර
(8) සකස් කරන ලද පැල අළෙවි කිරීමේ ව්‍යාපාරයක් / පැකට් කළ පොහොර අළෙවි කිරීමේ ව්‍යාපාරයක් / ගෙවතු විදුලි උපකරණ අළෙවි කිරීමේ ව්‍යාපාරයක්
(9) ජලය හා විදුලිබල පහසුකම් / සන්නිවේදන පහසුකම් / ප්‍රවාහන පහසුකම් / අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම්
(10) වත්කම පාවිච්චි කිරීමට ගිවිස ගන්නා කාලය තුළ කල්බද්ද වාරික වශයෙන් ගෙවීමේ ක්‍රමයට එකඟව කල්බදු ගැණුම්කරු හා කල්බදු සමාගම ගිවිස ගැනීම මූල්‍ය කල්බදු ක්‍රමයෙන් අදහස්වේ. (2 x 10 = 20)

02
(1) නව ව්‍යාපාර ඇරඹීම, රැකියා ලැබීම, ආදායම් ඉහළයාම, භාණ්ඩ හෝ සේවා තෝරාගැනීමට ඉඩකඩ ලැබීම, පරිභෝජන තත්ත්වය ඉහළයෑම, පුද්ගල ආකල්ප වෙනස්වීම
(2) මනෝ විභීතිය, සංස්කෘතිය, ආගම, පවුල, පරිසරය
(3) දැඩි අධිෂ්ඨානය, කැපවීම, නම්‍යශීලී බව, උනන්දුව, උපායශීලී බව
(4) සම්පත් අඩු පාසල්වලට අවශ්‍ය ඩෙස්, පුටු, ක්‍රීඩා භාණ්ඩ, පරිගණක ආදිය ලබාදීම / අඩු ආදායම් ඇති දරුවනට පාසල් ඇඳුම්, පොත්පත්, බෑග්, කවකටුපෙට්ටි, වතුර බෝතල් ආදිය ලබාදීම / පාසලක සියලු දරුවන් එකතුවී අරමුදලක් පිහිටුවා එම අරමුදල් වලින් ගොඩනැගිලි, පුස්තකාල ආදිය ඉදිකරදීම
(5) සමාජයීය පුද්ගල සුභසාධනය, සමාජයීය හා සංස්කෘතික සාරධර්ම පෝෂණය වීම, රජයට සුභසාධනය වෙනුවෙන් දැරීමට සිදුවන වියදම අවම වීම, මානව ප්‍රාග්ධනයේ ගුණාත්මක බව වැඩිවීම, පුද්ගලයින්ගේ දිළිඳුකම හා නූගත්කම ආශ්‍රිත ගැටළුවලට පිළියම් වීම.
(2 x 5 = 10)

03
(1) ආකාර 4 කි. (ල. 01) ආර්ථිකයට, සමාජයට, පවුලට, තමන්ට (ල. 01)
(2) ආයෝජිත ප්‍රාග්ධනය, සේවක සංඛ්‍යාව, භාවිතයට ගන්නා බලශක්ති ප්‍රමාණය, ස්ථාවර වත්කම්වල වටිනාකම, නිෂ්පාදන ධාරිතාව, වාර්ෂික පිරිවැටුම
(3) මූල්‍ය දුෂ්කරතා, දියුණු මට්ටමේ සැලසුම්කරණයක් නොවීම, සෑමවිටම කාර්යක්ෂම සේවකයින් බඳවා ගැනීම අපහසුවීම, කළමනාකරණ හැකියාව නොමැතිකම, තෝරාගත් ව්‍යාපාරික ස්ථානය නොගැළපීම, මහා පරිමාණ ව්‍යාපාර සමග තරග කිරීමේ අපහසුව
(4) පවුල, අධ්‍යාපනය, වයස, විනෝදාංශ, පළපුරුද්ද, විවාහය
(5) වැය කරන ලද කාලයේ ප්‍රමාණය, වැය කරන ලද ශක්තිය, ජීවිතයෙහි වැදගත් කාරණා අත්හැරීම, මුදල් ආයෝජනය සීමිත වූ සමාජ ජීවිතය, පෞද්ගලික උත්සාහය, පවුලේ සාමාජිකයන් සමග අඩු කාලයක් වැය කිරීම. (2 x 5 = 10)

04
(1) නොසැලකිලිමත් ලෙස යෙදවුම් මිලදී ගැනීම / පිරිවැය පාලනයක් නොමැතිවීම / අනවශ්‍ය මිලදීගැනීම / ඌණ සේවා නියුක්තිය නිසා ශ්‍රමය අපතේ යාම / අනවශ්‍ය අමුද්‍රව්‍ය තොග ගබඩාකරණය නිසා යල්පැනීම හා විනාශ වීම / නිෂ්පාදන දුර්වලතා නිසා ඉවත් කිරීම් වැඩි කිරීම
(2) අමුද්‍රව්‍ය ලබාගැනීමේ පහසුව / බලශක්තිය ලබාගැනීමේ පහසුව / පරිවහන පහසුව / පුහුණු හෝ නුපුහුණු ශ්‍රමය ලබාගැනීමේ පහසුව / වෙළඳපොළ වෙත පහසුවෙන් ළඟාවිය හැකි බව / දේශගුණය
(3) නියෝග පිළිපැදිය යුතුය, පහසුවෙන් හඳුනානොගත් හැකියාවන්, ස්ථිර ආදායම, සීමා සහිත වගකීම්, සේව්‍යයා මත යැපෙන පසුබිම, අදහස් ක්‍රියාත්මක කිරීමට අසීරු වීම
(4) සම්පත් සැපයීම, අවදානම් දැරීම, ප්‍රතිලාභ භුක්ති විඳීම
(5) අවශ්‍ය මුදල් හිඟකම, යන්ත්‍ර හිඟකම, පුහුණු සේවක හිඟකම (2 x 5 = 10)

05 (1) නිවැරදි බව, වේගය, අඩු පිරිවැය, රහස්‍යභාවය

(2) ව්‍යාපාරවලින් බිහිකරන නිෂ්පාදිත ගැණුම්කරුවන් අතට පත්කිරීමට අදාළ උපදෙස් අළෙවි උපදෙස් ලෙස හැඳින්විය හැකිය. උදා: ප්‍රචාරණ උපදෙස්, විකුණුම් ප්‍රවර්ධන උපදෙස්

(3) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, ගනුදෙනුකරුවෝ, සේවකයෝ

(4) ජනගහන වර්ධන වේගය, වයස් ව්‍යුහය, ස්ත්‍රී පුරුෂ භාවය, ප්‍රාදේශීය ව්‍යාප්තිය, ජන සංයුතිය, ජන සංඛ්‍යාව

(5) පුද්ගලයකු පුද්ගල කණ්ඩායමක් හෝ සංවිධානයක් හෝ මුහුණපාන ගැටළුවකට විසඳුමක් හෝ පාර්ශවයන්ගේ අවශ්‍යතාවක් ඉටුකළ හැකි දෙයක් හෝ පිළිබඳව ව්‍යවසායකයා තුළ පහළවෙන සිතුවිල්ලක් හෙවත් සංකල්පනාවක් වේ. (2 x 5 = 10)

06 (1) තනතුර, ආර්ථික තත්ත්වය, ජීවන රටාව, වයස, සහජීවන චක්‍ර අවධි

(2) විවිධ ක්‍රම උපයෝගී කරගනිමින් භාණ්ඩයක් සඳහා හැසිරීම පිළිබඳ පාරිභෝගික තොරතුරු රැස්කර ගැනීම වෙළඳපොළ සමීක්ෂණය නම් වේ.

(3) වෙළඳපොළ කොටස ප්‍රසාරණය වීම, ව්‍යාපාරයේ පිරිවැටුම වැඩිවීම, නව නිෂ්පාදිත වෙළඳපොළට හඳුන්වාදීමේ අවස්ථාව උදාවීම, ව්‍යාපාරයේ ආදායම වැඩිවීම, ව්‍යාපාරයේ කීර්ති නාමය වර්ධනය වීම.

(4) <u>කොමිස් නියෝජිතයා</u>

යම් නියෝජිතයකු වෙනුවෙන් භාණ්ඩ විකිණීමේ කටයුතුවල නියැලෙමින් ඒ මත ගිවිස ගත් යම් ප්‍රතිශතයක් කොමිස් මුදල් වශයෙන් ලබාගන්නා නියෝජිතයා ය.

<u>තැරැව්කරු</u>

භාණ්ඩ ගැණුම්කරුත්, විකුණුම්කරුත් අදාළ ගනුදෙනුවට සම්බන්ධ කරලමින් දෙපාර්ශවයෙන්ම තැරැව් ගාස්තු ලබාගන්නා තැනැත්තා ය.

(5) රූපවාහිනිය ඔස්සේ භාණ්ඩ අළෙවිකරණය, පුද්ගල විකුණුම් සෘජු තැපැල් අළෙවිකරණය, දුරකථන ඔස්සේ භාණ්ඩ අළෙවිකරණය විද්‍යුත් අළෙවිකරණය (2 x 5 = 10)

07 (1) වගකීම් සීමිත වීම, නෛතික පුද්ගලභාවය, අඛණ්ඩ පැවැත්ම, අධ්‍යක්ෂ මණ්ඩලයකින් පාලනය (ල. 02)

(2) <u>වාසිදායක ලක්ෂණ</u>

පහසුවෙන් ආරම්භ කළ හැකි වීම / අමතර ප්‍රාග්ධනය ලබාගැනීමේ පහසුව / හවුල් කළමනාකරණයක් පැවතීම / අවදානම බෙදීයාම (ල. 01)

<u>අවාසිදායක ලක්ෂණ</u>

වගකීම අසීමිත වීම / ක්ෂණික තීරණ ගැනීම අපහසු වීම / නෛතික පුද්ගලභාවයක් නොමැති වීම / අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම (ල. 01)

(3)

| ශීර්ෂය | කේවල ස්වාමි ව්‍යාපාරය | සීමා සහිත සමාගම් | සමුපකාර |
|---|---|---|---|
| 1. අයිතිය | ප්‍රාග්ධනය සැපයූ පුද්ගලයා සතුවීම. | කොටස් හිමියන් සතුය. | සාමාජිකයන් සතුය. අවමය 10 යි. |
| 2. ප්‍රාග්ධනය සපයා ගැනීම | අයිතිකරු විසිනි. | කොටස් නිකුතුවෙනි. | සාමාජිකයන්ගෙනි. |
| 3. කළමනාකරණය | අයිතිකරු විසිනි. | අධ්‍යක්ෂ මණ්ඩලයක් විසිනි. | අධ්‍යක්ෂ මණ්ඩලයක් විසිනි. |
| 4. පැවැත්ම | අඛණ්ඩ පැවැත්මක් නැත. | අඛණ්ඩ පැවැත්මක් ඇත. | අඛණ්ඩ පැවැත්මක් ඇත. |

(ල. 02) (ල. 02) (ල. 02)

The National e-Learning Portal for the General Education